**ශ්‍රම වාසනා අරමුදල - 2018**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

ශ්‍රම වාසනා අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම්

වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02** | | |
| i. සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 19,238,084 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී පූර්ව වර්ෂ ගැලපීම් වර්ෂයේ අතිරික්තයට ගලපා අතිරික්තය රු.17,576,743 ක් ලෙස සටහන් කර තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී පෙර වර්ෂයේ ලාභයෙන් කළ ගැලපීම වන රු. 1,661,340 ක මුදල සටහන් අංක 13 මගින් පෙන්වා වර්ෂයේ අතිරික්තය වක්‍ර ක්‍රමයට ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. අංක 02 හි 27 හි (ආ) අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල සටහන් කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීම පිළිබඳ ප්‍රමිතයේ නිශ්චිතව දක්වා ඇති කරුණුවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| ii. සමාලෝචිත වර්ෂය තුල මුදලින් ලද ස්ථාවර තැන්පතු පොලී ආදායම රු. 14,704,198 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ස්ථාවර තැන්පතු පොලිය ලෙස රු. 11,104,892 ක් පමණක් දක්වා තිබුණි. | ස්ථාවර තැන්පතුවලින් ලැබෙන පොලී ආදායම සටහන් කිරීම අරමුදල මගින් පාලන ගිණුමක් හරහා සිදු කිරීම මෙයට හේතු වී ඇත. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු සිදු කෙරේ. | ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය ලෙස මුදලින් ලද තැන්පතු පොලී ආදායම නිවැරදිව හඳුනාගෙන ඇතුලත් කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| iii. ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වූ මුදල් ගලායෑම් තුල අරමුදලේ වෙබ් අඩවිය සංවර්ධනය සඳහා මුදලින් වැය නොකරන ලද, වර්ෂය තුල කරන වෙන් කිරීමක් වූ රු. 390,000 ක් ද ඇතුළත් කර තිබුණි. | ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර. අංක 02 හි 27 හි (ආ) අනුව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් නොවන ස්වභාවයේ ගණුදෙනු සඳහාද අතීත හෝ අනාගත මෙහෙයුම් මුදල් ලැබීම්වල හෝ ගෙවීම්වල ඇති කිසියම් විලම්බිතයන් හෝ උපචිතයන් මුදල් ප්‍රකාශය තුල කරන ලද ආයෝජන ප්‍රතිපාදනයන් ලෙස ඇතුලත් කර ඇත. | විගණන ඡේදය ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් ගලැයෑම්වලට අදාල වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිසි අවබෝධයෙන් යුතුව වියදම් හඳුනාගෙන සකස්කල යුතු වීම. |
| iv. පූර්ව වර්ෂයේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම ලෙස හඳුනාගෙන තිබූ පර්යේෂණ හා සංවර්ධන, මෘදුකාංග සංවර්ධන හා කාර්ය මණ්ඩල පුහුණුව සඳහා වූ වියදම් රු. 1,069,665 සමාලෝචිත වර්ෂයේදී ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම් ලෙස නැවත හඳුනාගෙන තිබුණි. මෙයින් රු. 549,000 ක් වූ මෘදුකාංග සංවර්ධන වියදම මෘදුකාංග මිලදී ගැනීම් ලෙස නැවත ස්ථාවර වත්කම් මිලදී ගැනීම් සඳහා මුදල් ගලා යාම් ලෙස හඳුනාගෙන තිබූ අතර ඉතිරි රු. 520,665 ක් වර්ෂයේ මෙහෙයුම් ලාභයෙන් අඩුකර දක්වා තිබුණි. මේ නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ඉදිරිපත් කිරීම නිවැරදි නොවුණි. | ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර. අංක 02 හි 27 හි (ආ) අනුව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් නොවන ස්වභාවයේ ගණුදෙනු සඳහාද අතීත හෝ අනාගත මෙහෙයුම් මුදල් ලැබීම්වල හෝ ගෙවීම්වල ඇති කිසියම් විලම්බිතයන් හෝ උපචිතයන් මුදල් ප්‍රකාශය තුල කරන ලද ආයෝජන ප්‍රතිපාදනයන් ලෙස ඇතුලත් කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සමාලෝචිත වර්ෂයට අදාල මුදල් ගලායාම් පමණක් ඇතුළත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කළ යුතුය. |
| **(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03** | | |
| පෙර වර්ෂවලට අදාලව ප්‍රවර්ථන වර්ෂයේ කරන ලද රු. 1,661,340 ක් වූ ගැලපීම් තුළ වූ ගනුදෙනු හා සිද්ධීන්ට අදාලව ප්‍රමිතයෙහි අංක 47, 50, 54 (අ), (ආ), | 2017 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී 2018 වර්ෂයේ සමුච්චිත අරමුදලට ගැලපීම් සිදුකරන ලද රු. 1,661,340 | ප්‍රමිතවල නිශ්චිතව දක්වා ඇති කරුණුවලට අනුකූලව අරමුදල විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) වගන්ති වලින් දක්වා ඇති මගපෙන්වීම් වලට අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | ක මුදල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ට අනුව අතීතානුයෝගී ලෙස සංසන්ධනාත්මක ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර ඇත. ඉදිරියේදී ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව ඉදිරිපත් කිරීම් වැඩි දියුණු කිරීමට කටයුතු යොදනු ලැබේ. | |
| **(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07** | | |
| i. ප්‍රමිතයෙහි 49 වගන්තිය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම් අයිතමය අයත්වන වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු බවට දක්වා ඇතත් ඊට පටහැනිව අරමුදල විසින් 2018 වර්ෂය තුලදී වත්කම් පන්ති 3 කට අදාල වත්කම් අයිතමයන් 14 ක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. | ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර. අංක 07 පිළිබඳ දේපල පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය සිදු කිරීමේදී එම වත්කම් අයිතමයන් අයත්වන වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු යොදනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවල නිශ්චිතව දක්වා ඇති කරුණුවලට පටහැනි නොවන ආකාරයට මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු වීම. |
| ii. ප්‍රමිතයෙහි 52 වගන්තිය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය ප්‍රත්‍යාගණන සංචිතයට බැරකළ යුතු වුවත් රු. 211,700 ක ප්‍රත්‍යාගණන ලාභය ලාභාලාභ ගිණුමේ වෙනත් ආදායම් ලෙස වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අරමුදල විසින් ප්‍රත්‍යාගණනයෙන් පැනනැගුනු ලාභය ආදයම් ප්‍රකාශනයේ ආදායමට එකතු කර දක්වන ලදී. ඉදිරියේදී ශ්‍රී.රා.අ.ගි.ප්‍ර. අංක 07 හි 55 වගන්තියට අනුව ප්‍රත්‍යාගණන ලාභය සමුච්ත අරමුදලට බැර කිරීමට කටයුතු සිදුකරනු ඇත. | -එම- |

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08**

| | | |
|---|---|---|
| ප්‍රමිතයෙහි 100 වගන්තිය ප්‍රකාරව හෙළිදරව් කළ යුතු 2016 වර්ෂයේ සේවයෙන් ඉවත් කළ නිලධාරීන් දෙදෙනෙකු විසින් අරමුදලට විරුද්ධව කම්කරු උසාවියට කරන ලද පැමිණිල්ලක් සමාලෝචිත වර්ෂය වන විට විභාග වෙමින් පැවතුණද, මූල්‍ය ප්‍රකාශන තුලින් අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල අරමුදලට විරුද්ධව පවරා ඇති නඩුව පිළිබඳ හෙළිදරව් කිරීමක් සිදු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. | ප්‍රමිතයට අනුකූලව මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය හෙළිදරවු කිරීම් සහිතව පිළියෙල කළ යුතු වීම. |

## 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විෂය** | **මුදල (රු.)** | **නොසැපයූ විගණන සාක්ෂි** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| ශ්‍රම වාසනා අරමුදල මගින් පාසල් ළමුන්ට ශිෂ්‍යත්ව ලබාදීම | 1,691,750 | වෘත්තීය අනතුරු හේතුවෙන් දෙමාපියන් මියගිය සිසුන් 50 දෙනෙකුට රු. 1,691,750 ක ශිෂ්‍යත්ව මුදල් ලබාදී තිබුණද ශිෂ්‍යත්ව ලබා දුන් සිසුන්ගේ තොරතුරු තහවුරු කර ගැනීමට විස්තර ඉදිරිපත් නොකෙරුණි. | අනතුරු සම්බන්ධයෙන් නීතිමය කටයුතු පවතින විට මියගිය හෝ ආබාධිත සේවකයන්ගේ සේවා ස්ථානවලින් සේවකයා පිළිබඳ තහවුරුවක් ලබා ගැනීම අපහසු විය. මෙවැනි අවස්ථාවක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නිර්නායක මත ප්‍රතිලාභ කමිටුව විසින් අනුමත කිරීම සිදු කරයි. | ප්‍රතිලාභ ලබාදීමට ප්‍රථම අදාල ප්‍රතිලාභීන්ගෙන් සුදුසුකම් ලැබීමේ නිර්නායක සපුරා තිබේද යන්න සලකා බැලීමට කටයුතු කළ යුතු වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1983 අංක 12 දරණ පාරිතෝෂික පනතේ 20 වගන්තිය | අරමුදල විසින් 2018 වර්ෂය සඳහා සේවකයන් 04 දෙනෙකු වෙත පාරිතෝෂික වෙන් කිරීම් ගණනය කිරීමේදී මූලික වැටුප පමණක් සැලකිල්ලට ගෙන තිබූ අතර ඒ හේතුවෙන් පාරිතෝෂික සඳහා වෙන් කිරීම් රු.140,400 ක් අඩුවෙන් වෙන්කර තිබුණි. | 2018 වර්ෂයේ පාරිතෝෂික ගණනය කිරීමේදී මූලික වැටුප පමණක් පදනම් කොටගෙන වෙන් කිරීම් සිදු කරන ලද නමුත්, පාරිතෝෂික ගෙවීමේදී අදාල කරගත යුතු දීමනා වන ජීවන වියදම් දීමනාවද එකතු කර 2018 වර්ෂයේදී සිදු කරන ලද වෙන් කිරීම් නිවැරදිව කිරීමට කටයුතු යොදනු ඇත. | පාරිතෝෂික පනතේ සහ අදාල චක්‍රලේඛයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වෙනස් කිරීම් කළ යුතු වීම. |

## 1.7 මුදල් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත වියදම රු. 58,900,000 ක් වූ අතර, එම වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 30 ක් ලබාගෙන තිබුණි. නමුත් එලෙස ලබාගත් මුදල් සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අයවැය ගත වැඩසටහන්වලට භාවිතා නොකර රු | ජාතික සම්පත ලොතරැයියෙන් ලැබෙන ආදායම ලොතරැයි මණ්ඩලය විසින් ශ්‍රම වාසනා අරමුදල නමින් වූ ඒකාබද්ධ අරමුදලට බැරකරනු ලබයි. එම අරමුදල, ශ්‍රම වාසනා අරමුදලට ලබා ගැනීමට අරමුදල සිදුකරනු ලබන වැඩසටහන් ප්‍රමාණය හෝ ඒ සඳහා වැයකරනු ලබන මුදල් ප්‍රමාණය අදාල නොවනු ඇති | සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන්වලට අරමුදලේ මුදල් කාර්යක්ෂමව, ඵලදායීව හා පිරිමැසුම්දායීව භාවිතා කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| මිලියන 20 ක් මහජන බැංකුවේ සියයට 11ක් සහ සියයට 10.5ක් බැගින් වූ පොලී අනුපාත යටතේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | බවත්, භාණ්ඩාගාරයට අරමුදලේ මුදල් එකවර නිකුත් කිරීමට නොහැකි නිසා පමණක් වරින් වර නිකුත් කිරීම සිදුකරනු ලබයි. එම මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර කල් පිරුණු පසු පොලිය හා තැන්පතු මුදල වැඩසටහන් සඳහා භාවිතා කරයි. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 19,238,084 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 13,155,579 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,082,504 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ලොතරැයි ආදායම රු. 5,728,181කින් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල විසින් මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර තිබුණද එය, 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර එම චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩල නිපුණතා අවශ්‍යතාවයන් හඳුනාගෙන නොතිබුණි. | ආයතනය විසින් සියලුම සේවකයන් අවුරුද්දකට වතාවක් ඇගයීමකට ලක්කර ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගනිමින් මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇති අතර රා.ප.චක්‍රලේඛ 02/2018 අනුව ඉදිරියේදී වැඩිදියුණු කිරීමට කටයුතු කරනු ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව අරමුදලේ කාර්ය මණ්ඩල නිපුණතා අවශ්‍යතාවයන් හඳුනාගැනීමට කටයුතු කළ යුතු අතර, මානව සම්පත් සැලැස්ම සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතු වීම. |